පරිගණක අධ්‍යයන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය
දැන්වීමයි

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ ඉංජිනේරු සහ නඩත්තු අංශයේ තබා ඇති ගොඩනැගිලි නවීකරණය කිරීමේදී ගලවා ඉවත් කරණ ලද අබලි භාණ්ඩ / ද්‍රව්‍ය තොග කොළඹ විශ්වවිද්‍යාලයේ, මණ්ඩප / ආයතන / පීඨ / දෙපාර්තමේන්තු / අංශවල කාර්ය මණ්ඩලය සහ බාහිර ගැනුම්කරුවන් අතර මුද්‍රා තබන ලද ලංසු කැඳවීමෙන් පසු ඉදිරිපත් කරන ලද ඉහළම ලංසුවට ආයතනය සෑහීමකට පත් වන්නේ නම් විකිණීම සඳහා **2020.03.02** වන සඳුදා දින දක්වා මිල කැඳවුම්පත් බාරගනු ලැබේ.

<u>ලංසු විවෘත කරන ස්ථානය සහ දිනය</u>

මාණ්ඩලික රැස්වීම් ශාලා අංක 01 - පරිගණක අධ්‍යයන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය - **<u>2020 මාර්තු 02</u>** දින <u>පස්වරු **2.30** සිට **3.30**</u> දක්වා

අදාළ භාණ්ඩ ද්‍රව්‍ය/තොග පිළිබඳව විස්තරාත්මක ලේඛනයක් මේ සමඟ අමුණා ඇති අතර, **<u>2020</u>** <u>පෙබරවාරි මස 27 සහ **28** දෙදින පෙරවරු **9.30** සිට **12.00**</u> දක්වා වූ කාලය තුළ නඩත්තු අංශයේදී එම භාණ්ඩ/ද්‍රව්‍ය තොග පරීක්ෂා කිරීමට අවස්ථාව සලසා තිබේ.

2020.02.18 වන දින සිට **2020.03.02** දක්වා <u>පෙරවරු **9.00** ත් පස්වරු **2.30** ත්</u> අතර (දිවා විවේකය හැර) පරිගණක අධ්‍යයන ආයතනයේ සරප් අංශය වෙත <u>ආපසු නොගෙවීමේ පදනම මත වන රු.500/-</u> ක මුදලක් ගෙවිය යුතුය. ඒ සඳහා නිකුත් කරනු ලබන රිසිට්පත සාමාන්‍ය පාලන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් ලංසු ලියවිලි ලබාගත හැකිය.

එම ලංසු ලියවිලි බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "ඉංජිනේරු හා නඩත්තු අංශයේ අබලි භාණ්ඩ සඳහා මිල ගණන් කැඳවීම." යනුවෙන් සඳහන් කර <u>**2020** මාර්තු **02** වන දින පස්වරු **2.30**</u> ට පෙර <u>නියෝජ්‍ය ලේඛකාධිකාරි / සාමාන්‍ය පාලන අංශය පරිගණක අධ්‍යයන ආයතනය, **35**, රීඩ් මාවත, කොළඹ **07**</u> ලිපිනයට ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් හෝ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හැකිය.

තමන් මිලට ගත් භාණ්ඩ ද්‍රව්‍ය/තොග සඳහා ගෙවිය යුතු සම්පූර්ණ මුදල් පරිගණක අධ්‍යයන ආයතනයේ, සරප් වෙත ගෙවීමෙන් පසුව **<u>2020 මාර්තු 03</u>** වන දිනයේම අදාළ රිසිට්පත <u>නියෝජ්‍ය ලේඛකාධිකාරි සාමාන්‍ය පාලන අංශය</u> වෙත ඉදිරිපත් කළ යුතුය. මිලට ගන්නා භාණ්ඩ ද්‍රව්‍ය/තොග එදිනම ඉවත් කර ගත යුතු අතර කිසිදු හේතුවක් නිසා හෝ විශ්වවිද්‍යාල කාර්යාල තුළ හෝ විශ්වවිද්‍යාල භූමියේ එම භාණ්ඩ තැබීම නීති විරෝධී වන අතර එලෙස ඉවත් කර නොගන්නා භාණ්ඩ විශ්වවිද්‍යාලය සතු දේපළ ලෙස සලකා ඉදිරි නීතිමය කටයුතු කරනු ලබන බව දන්වමි.

මිළදී ගන්නා ලද භාණ්ඩ ද්‍රව්‍ය/තොග විශ්වවිද්‍යාලීය භූමියෙන් පිටතට ගෙන යන විටදී ගේට්ටු අවසර පත්‍රයක් සාමාන්‍ය පාලන අංශයෙන් ලබා ගත යුතු අතර, එම අවසර පත්‍රය ආරක්ෂක නිලධාරීන් හට ඉදිරිපත් කිරීමෙන් ඔබ විසින් ලබා ගත් භාණ්ඩ ද්‍රව්‍ය/තොග විශ්වවිද්‍යාලීය භූමියෙන් පිටතට ගෙන යාමට ඔබට අවකාශ ලැබේ.

අධ්‍යක්ෂක
පරිගණක අධ්‍යයන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය.
කොළඹ 03.
2020.02.17